# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2003 අංක 27 දරන තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ පනත

---

[සහතිකය සටහන් කළේ **2003** සැප්තැම්බර් මස **09** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 සැප්තැම්බර් මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 8.25 යි.** තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2003 අංක 27 දරන තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ පනත**

[සහතිකය සටහන් කළේ 2003 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.–ඕ. 7/2003.

**ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියා සැලසුමක් පිළියෙල කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය සඳහා වූ කාර්ය බලකායක් පත්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම භාරව සිටින ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය සහ පනතේ කාලසීමාව.

1. (1) මේ පනත 2003 අංක 27 දරන තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තොරතුරු තාක්ෂණ විෂය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී, ක්‍රියාත්මක විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට අවුරුදු පහක කාලයක් සඳහා බලාත්මක විය යුතු ය.

I වන කොටස

**තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලැස්ම**

තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතු බව.

**2.** කර්මාන්තයේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය විසින් කලින් කල තොරතුරු සහ සංනිවේදන තාක්ෂණයට අදාළ ජාතික ප්‍රතිපත්ති ව්‍යුහය අනුමත කරනු ලැබිය යුතු ය.

තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ කාර්ය බලකාය පත් කිරීම.

**3.** (1) 2 වන වගන්තිය යටතේ සකස් කරන ලද තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාව තුළ යථා පරිදි ක්‍රියාත්මක කරන බවට සහතික වීම පිණිස, අමාත්‍ය මණ්ඩලය විසින් (මෙහි මින් මතු "කාර්ය බලකාය" යනුවෙන් සඳහන්

2—H 18086—4,500 (2003/05)

කරනු ලබන) සාමාජිකයන් විසි දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ කාර්ය බලකායක් පත් කරනු ලැබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ එක් සාමාජිකයෙක් කාර්ය බලකායේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය, විදුලි සංදේශ කටයුතු, නීතිය, ව්‍යාපාර සහ මූල්‍ය කටයුතු යන ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම ඇති තැනැත්තන් අතරින් කාර්ය බලකායේ සාමාජිකයන් තෝරාගනු ලැබිය යුතු ය.

කාර්ය බලකායේ කර්තව්‍ය.

4. (අ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියකට අනුකූලව ක්‍රියා සැලසුමක් පිළියෙල කිරීම ;

(ආ) රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය යන දෙකේම තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලැසුම ක්‍රියාත්මක කිරීමේ දී සම්බන්ධීකරණය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම ;

(ඇ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලසුම ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනවලට කලින් කල විධාන නිකුත් කිරීම ;

(ඈ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාව තුළ ජනප්‍රිය කළ හැකි ආකාරය හඳුනා ගනිමින් සැලසුම් සකස් කිරීම ;

(ඉ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය මානව සම්පත් සංවර්ධනයට, නිෂ්පාදනවලට, සේවාවලට, වෙළෙඳපලවලට සහ ගනුදෙනුවලට අදාළ කර ගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් ප්‍රමිතීන් හඳුනාගැනීම, සංවර්ධනය කිරීම සහ ඒවා අනුගමනය කිරීමට කටයුතු සැලැස්වීම ; සහ

(ඊ) පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නියෝග සෑදීමට අවශ්‍යවන අවස්ථාවන්හි දී එසේ කිරීමට නිර්දේශ කිරීම,

කාර්ය බලකායේ කර්තව්‍ය විය යුතු ය.

II වන කොටස

## තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව

**5.** (1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව.

(2) කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) කමිටුවේ සියලු රැස්වීම්වල මූලසුන දැරිය යුතු අමාත්‍යවරයා ;

(ආ) විදුලි සංදේශ විෂයය භාර අමාත්‍යවරයා ;

(ඇ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා ;

(ඈ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා ;

(ඉ) රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා ;

(ඊ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ කර්මාන්තයේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි එක් එක් වර්ගවලට සම්බන්ධතාවක් ඇති තැනැත්තන් සම්බන්ධයෙන් සාමාජිකයන් සංඛ්‍යාවක් අදාළ අමාත්‍යවරුන් විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය සඳහා ප්‍රතිපත්ති සාකච්ඡා කිරීමේ කාර්ය, වැඩ සටහන් සහ සැලසුම් පිළියෙල කිරීම සහ එහි ක්‍රියාත්මක වීම කලින් කල සමාලෝචනය කිරීම කමිටුවේ වගකීම විය යුතු ය.

(4) කමිටුව අවම වශයෙන් මාස හතරකට එක් වරක්වත් රැස්විය යුතු ය.

(5) සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(6) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ සහ විධාන කමිටුව විසින් කාර්ය බලකායට නිකුත් කළ යුතු ය.

## III වන කොටස

### සාමාන්‍ය

### ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය පිහිටුවීම

ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය කාර්ය බලකායට සහ කමිටුවට සහාය දිය යුතු බව.

**6.** (1) (1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ) ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය, කාර්ය බලකායට සහ කමිටුවට සහාය ලබා දෙන, විධායක නියෝජිත ආයතනය විය යුතු ය.

(2) සාංගමික ව්‍යවස්ථාවලියෙහි සහ සාංගමික සංස්ථාපනයෙහි දක්වා ඇති පරිදි නියෝජිත ආයතනයේ බලතල සහ කර්තව්‍යවලට අමතරව, එම නියෝජිත ආයතනයට පහත සඳහන් බලතල සහ කර්තව්‍ය තිබිය යුතු ය :—

(අ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම සහ අමාත්‍ය මණ්ඩලයට සහ කමිටුවට ආධාර කිරීම ;

(ආ) ජාතික ප්‍රතිපත්තියේ සහ ක්‍රියා සැලැසුමෙහි ඇතුළත් කළ යුතු යෝජනා ඉදිරිපත් කිරීම ;

(ඇ) සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලැසුම ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම සහ එය කලින් කල නියාමනය කිරීම සහ සමාලෝචනය කිරීම ;

(ඇ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලැස්මට අනුකූලව රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම ක්‍රියාත්මක කිරීමට ඇති ක්‍රමෝපාය සහ වැඩසටහන් පිළියෙල කිරීම ;

(ඉ) තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු සැපයීම ;

(ඊ) ක්‍රියා සැලැසුම සකස් කිරීමෙහි ලා සැලකිල්ලට ගත යුතු කරුණු කාර්ය බලකායට නිර්දේශ කිරීම ;

(උ) ජාතික ප්‍රතිපත්තියෙහි සහ ක්‍රියා සැලැසුමෙහි ඇතුළත් කළ යුතු කරුණු සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීම ; සහ

(ඌ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලැස්මට අනුකූලව රාජ්‍ය අංශයෙහි සහ පෞද්ගලික අංශයෙහි ක්‍රියාත්මක කළ යුතු ක්‍රමෝපායන් සහ වැඩසටහන් සකස් කිරීම.

අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කළ යුතු බව.

**7.** (1) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති පරිදි තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ කරුණු පිළිබඳ විධාන සහ මාර්ගෝපදේශ අමාත්‍යවරයා විසින් කලින් කල නියෝජිත ආයතනයට සහ වෙනත් අදාළ රාජ්‍ය නියෝජිත ආයතනවලට නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියා සැලසුම ක්‍රියාත්මක කිරීමට අදාළ වන තාක්දුරට ඒ ක්‍රියාත්මක කිරීමේ ආකාරය, ක්‍රමය සහ ප්‍රමාණයට අදාළ විධාන සහ මාර්ගෝපදේශ අමාත්‍යවරයා විසින් කලින් කල කාර්ය බලකායට නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) කාර්ය බලකාය, නියෝජිත ආයතනය සහ අදාළ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, ආයතන සහ රජයේ සහ පෞද්ගලික අංශයේ වෙනත් නියෝජිත ආයතන එකී විධානවලට අනුකූලව ක්‍රියා කිරීම එම ආයතන වල කාර්යය විය යුතු ය.

නියෝජිත ආයතනය, බදු ආදිය ගෙවීමෙන් නිදහස් විය යුතු බව.

**8.** (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව අවසර දෙනු ලැබූ ප්‍රමාණයට නියෝජිත ආයතනයේ ආදායම සහ ලාභ මත යම් බද්දක් ගෙවීමෙන් නියෝජිත ආයතනය නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් භාණ්ඩයක් ප්‍රදානය කිරීම හෝ ආනයනය කිරීම හෝ මිල දී ගැනීම නියෝජිත ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා උපයෝගී වන බවට සලකනු ලබන්නේ නම්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියෝජිත ආයතනයට ප්‍රදානය කරන ලද හෝ මිල දී ගන්නා ලද යම් භාණ්ඩ මත රේගු බදු හෝ නිෂ්පාදන බදු අයකිරීමෙන් ඒ නියෝජිත ආයතනය නිදහස් කරනු ලැබිය යුතු ය.

(3) ලබාදෙන ලද සේවය සඳහා නියෝජිත ආයතනයට ගෙවීමක් කර හෝ නියෝජිත ආයතනයට පොදුවේ සහායක් වශයෙන් යම් දායක මුදලක් ගෙවන යම් තැනැත්තකු විසින් ආදායම් බදු සඳහා වගකීම ගණන් බැලීමේ කාර්ය සඳහා, එම ගෙවීම ඇත්ත වශයෙන් සිදු කළ වර්ෂය තුළ ආදායමෙන් එම මුදල අඩුකරන ලෙස හිමිකම් පෑම කළ හැකි ය.

නියෝග.

**9.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා සහ නියම කිරීම සඳහා මේ පනත මගින් නියම කර ඇති හෝ බලය පවරා ඇති යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් කරුණු වලින් සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එම ප්‍රතිපත්තියේ ව්‍යුහය ඇතුළත අවශ්‍යතාක් දුරට විවිධ අංශ සඳහා ආචාර ධර්ම පද්ධති සඳහා ;

(ආ) ජාතික ප්‍රතිපත්තිය ප්‍රකාරව සකස් කළ යුතු යම් ක්‍රියා සැලැස්මක ආකෘතිය සහ අන්තර්ගත කරුණු ;

(ඇ) තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය, මානව සම්පත් සංවර්ධනයට, නිෂ්පාදනවලට, සේවාවලට, වෙළෙඳපලවලට සහ ගනුදෙනුවලට අදාළ කරගැනීම සඳහා ජාත්‍යන්තරව ප්‍රසිද්ධියට පත් ප්‍රමිතීන් ; සහ

(ඈ) කමිටුවේ කර්තව්‍යය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම අනුමැතිය සඳහා හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට අනුමත කරනු නොලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ මීට පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් අනුමත කරනු නොලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**10.** (1) තොරතුරු තාක්ෂණ සභාව (සින්ටෙක්) පිහිටුවීම සඳහා විධිවිධාන සලස්වන ලද 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ III වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට බලපවත්වන පරිදි තොරතුරු තාක්ෂණ සභාවට (සින්ටෙක්) අයත් සියලු චංචල හා නිශ්චල දේපළ සහ එම සභාවේ සියලු වත්කම් සහ බැරකම් මේ පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව විධායක නියෝජිත ආයතනය වන ශ්‍රී ලංකා තොරතුරු සහ සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය වෙත පැවරිය යුතු ය.

(3) එසේ ඉවත් කිරීම නොතකා 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 14 වන වගන්තියේ දක්වා ඇති තොරතුරු තාක්ෂණ සභාවේ කර්තව්‍යවලට අදාළව සභාව විසින් පවත්වාගෙන යනු ලබන සියලු කටයුතු අවසන් වන තුරු සභාව විසින් එම කටයුතු පවත්වාගෙන ගොස් අවසන් කළ යුතු ය.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.